මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/1/16/3
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.07.16

**ජාතික අයවැය චක්‍රලේඛ අංක. 03/2018**

සියලුම: අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

<u>රාජ්‍ය ආයතන සඳහා මෝටර් වාහන ප්‍රසම්පාදනය</u>

2018 අප්‍රේල් මස 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, රාජ්‍ය ආයතනවල භාවිතය සඳහා මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති පරිදි අත්පිට මුදලට, මූල්‍ය කල්බදු ක්‍රමය සහ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් වාහන මිලදී ගැනීම අනුමතකර ඇත. ඒ අනුව, වාහන මිලදී ගැනීම සඳහා මෙම චක්‍රලේඛයේ ලබාදී ඇති උපදෙස් පිළිපැදීම සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නිරතව සිටින සියලුම නිලධාරීන්ගේ වගකීම වේ.

**02. අදාළවීම**

මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ වනුයේ :

(i) ඒකාබද්ධ අරමුදලින් අරමුදල් සපයනු ලබන රාජ්‍ය ආයතන - අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක සහ රාජ්‍ය ආයතන
(ii) පළාත් සභා සහ පළාත් පාලන ආයතන

ඒකාබද්ධ අරමුදලින් අරමුදල් සැපයීමක් සිදු නොකරනු ලබන රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් වන වාහන ප්‍රසම්පාදනයට අදාළව වෙනම චක්‍රලේඛයක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කෙරෙනු ඇත.

**03.** **වාහන අවශ්‍යතා තක්සේරු කිරීම**

(අ) වාහන මිලදී ගැනීම සඳහා වන සියළුම ඉල්ලීම් නිසිපරිදි සම්පූර්ණ කරන ලද, මෙම චක්‍රලේඛයේ **ඇමුණුම I** හි දක්වා ඇති ආකෘති පත්‍රය මඟින් අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා හරහා මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට පෙර එම ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතිත්වය දරණ කමිටුවක් මගින් පහත නිර්ණායකයන් අනුව සමාලෝචනය කළ යුතුය.

(i) වාහනය/වාහන අවශ්‍යතාවය සඳහා වන හේතු.
(ii) ආයතනයේ වාහන අවශ්‍යතාවය හා දැනට පවතින වාහන සංචිතය .
(iii) දැනට පවතින ප්‍රතිස්ථාපනය කිරීමට නියමිත වාහනයේ/වාහනවල ආයුකාලය සහ තත්ත්වය.
(iv) පවතින වාහනය/වාහන සඳහා පසුගිය වර්ෂ 3ක නඩත්තු පිරිවැය.
(v) වෙන්කර ඇති වාහන සංඛ්‍යාව සහ ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරීන් සංඛ්‍යාව.
(vi) අංක 02/2015 හා 2015.07.10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අපහරණය කරන ලද වාහන සංඛ්‍යාව .
(vii) මෙම චක්‍රලේඛයේ පවතින ප්‍රතිපාදන සහ මෙම සමාලෝචනය සඳහා යෝග්‍ය වන වෙනත් කරුණු .

(ආ) රජයේ වාහන ඵලදායී අයුරින් භාවිතා කිරීම සහතික කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම්, රාජ්‍ය ආයතනයට අදාළවන පහත කරුණු සළකා බලමින්, කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් විධිමත් අධ්‍යයනයක් කරනු ඇත.

(i) සමාලෝචන කමිටුවේ නිර්දේශය
(ii) ආයතනික විධිවිධාන
(iii) සංචිතයේ පවත්නා වාහන උපරිම ආර්ථික ඵලදායිතාවයක් ලැබෙන ලෙස භාවිතා කිරීම.
(iv) රාජ්‍ය අයතනයේ පවතින වාහන සංචිතය තුළ අවශ්‍යතාවය කළමනාකරණය කරගැනීමේ හැකියාව .

(ඇ) ඉහත කරුණු සළකා බැලීමෙන් අනතුරුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් ඔහුගේ/ඇයගේ නිර්දේශ සහිතව එම අයදුම්පත ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත .

**04.** **මහා භාණ්ඩාගාරයේ අනුමැතිය**

වාහන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ නිර්දේශ මත පදනම්ව හා පවත්නා මූල්‍ය සම්පත් අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වාහන ප්‍රසම්පාදනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙනු ඇත.

05 ඡේදයේ විස්තර කර ඇති එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව අනුමැතිය ලබාදීමේ ආදර්ශ ලිපි **ඇමුණුම් II, III** සහ **IV** හි දක්වා ඇත.

**05. ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

මෙම චක්‍රලේඛයේ 04 ඡේදයේ සඳහන් අනුමැතිය පරිදි, අදාළ රාජ්‍ය ආයතනය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් විධිමත්ව අනුගමනය කරමින් ලබා දී ඇති අනුමැතිය අනුව, මෙම චක්‍රලේඛයේ 05(අ) හෝ 05(ආ) හෝ 05(ඇ) ඡේදයන්හි දක්වා ඇති ක්‍රමයන් අනුගමනය කරමින් අදාළ වාහන ප්‍රසම්පාදනය කර ගතයුතුය.

**(අ) සෘජු මිලදී ගැනීමේ ක්‍රමය**

පහත සඳහන් කාණ්ඩයන්ට අදාළව ලබාදී ඇති මිල සීමාවන් තුළ ලියාපදිංචි නොකළ (නවතම) වාහන මෙම ක්‍රමය යටතේ මිලදී ගත හැකිය.

| කාණ්ඩය | විස්තරය | සියළු බදු ඇතුළත් මිල සීමාව (එක වාහනයකට රු.මි.) |
|---|---|---|
| අ. i | ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2016.07.14 දිනැති අංක CSA/1/6 දරණ චක්‍රලේඛය සහ එයට පසුව සිදුකරන ලද සංශෝධනයන්ට අනුව කථානායක/කැබිනට් අමාත්‍යවරු/විපක්ෂ නායක/පළාත් ආණ්ඩුකාරවරු/පළාත් ප්‍රධාන අමාත්‍යවරු/රාජ්‍ය අමාත්‍යවරු/නියෝජ්‍ය කථානායක/ නියෝජ්‍ය කැබිනට් අමාත්‍යවරු | 43.00 |
| අ. ii | ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද අංක 2016.07.14 දිනැති CSA/1/6 දරණ චක්‍රලේඛය සහ එයට පසුව සිදුකරන ලද සංශෝධනයන්ට අනුව පළාත් අමාත්‍යවරු/පළාත් සභා සභාපතිවරු/පළාත් සභා නියෝජ්‍ය සභාපතිවරු | 36.00 |
| අ. iii | අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් ප්‍රධාන ලේකම්වරු හෝ සමාන මට්ටමේ නිලධාරීන් | වාහනවල වෙළඳපල වටිනාකම සළකා බලමින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන පරිදි |
| අ. iv | දිස්ත්‍රික් ලේකම්වරු. | |
| අ. v | විදේශ ආධාර ලබන ව්‍යාපෘති මගින් මිලදීගනු ලබන වාහන | |
| අ. vi | ට්‍රැක්ටර් රථ, ලොරි, ට්‍රක් රථ, ගලිබවුසර්, බැකෝ, වාහන ඔසවන ක්‍රේන්, බස් රථ, ගිලන් රථ, කෘ කැබ් රථ, ත්‍රීරෝද රථ, යතුරුපැදි වැනි උපයෝජිත වාහන හා විශේෂ අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබන වෙනත් වාහන | |

(ආ) මූල්‍ය කල්බදු ක්‍රමය -

I. මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමේදී පහත ක්‍රමවේදය අනුගමනය කළයුතුය.

අ **කල්බදු සමාගම් තෝරා ගැනීම:** ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් කල්බදු ව්‍යාපාරයේ නිරත වන රාජ්‍ය බැංකු අතුරින් අපේක්ෂිත කල්බදු පහසුකම් සපයන්නා තෝරාගනු ලැබේ. මෙම චක්‍රලේඛයේ 4 ඡේදයේ සඳහන් පරිදි අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් පසුව අදාළ ආයතන විසින් එම තෝරාගත් කල්බදු සමාගම හරහා අදාළ වාහන ප්‍රසම්පාදනය කර ගතයුතුය.

ආ **මිලදී ගැනීමේ ඇණවුම ඉදිරිපත් කිරීම:** කල්බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන් ප්‍රකාරව, අදාළ රාජ්‍ය ආයතනය විසින් තොරාගත් වාහන සැපයුම්කරු වෙත අදාළ කල්බදු පහසුකම් සපයන්නා හරහා මිලදී ගැනීමේ ඇණවුම ඉදිරිපත් කළයුතුය.

ඇ **කල්බදු ගෙවීමේ ක්‍රමය:** වාහනය/වාහන ලබාගන්නා රාජ්‍ය ආයතනය විසින් කල්බදු පහසුකම් සපයන්නා වෙත සමාන මාසික වාරික 60 කින් කල්බදු ගෙවීම් සිදු කළයුතුය. එනම් ප්‍රාග්ධන ගෙවීම සහ පොලී ගෙවීම් වශයෙනි .

ඈ **වාහනය රක්ෂණය කිරීම:** එසේ මිලදී ගත් වාහනය/වාහන අදාළ රාජ්‍ය ආයතනයන් විසින් වෙළඳපල වටිනාකමට රක්ෂණය කළයුතුය.

ඉ **හිමිකම හා පැවරීමේ හැකියාව:** මෙම ක්‍රමය යටතේ මිලදී ගත් වාහනය/වාහන අදාළ රාජ්‍ය ආයතනය මගින් ලේඛනගත කළයුතු අතර, අවසන් වාරිකය ගෙවා නිමවන තෙක් එම වාහන පැවරීම හෝ අපහරණය කිරීම සිදු නොකළ යුතුය.

ඊ **තොරතුරු වාර්තාගත කිරීම:** රජයේ ආයතන විසින් වාහනයේ ලියාපදිංචි අංකය, වාහන වර්ගය, කල්බදු වටිනාකම සහ කල්බදු ගෙවීමේ තත්වය, පවරන ලද නිලධාරීන් ආදී තොරතුරු නව පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම්කරණ පද්ධතිය (new CIGAS) ඔස්සේ වාර්තාගත කළයුතු අතර, එම තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ද ලබාදිය යුතුය.

උ **ගිණුම්ගත කිරීම:** අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ විශේෂ වියදම් කිරීමේ ඒකක විසින් හඳුනාගත් කල්බදු වත්කම් (වාහන) නව පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම්කරණ පද්ධතිය (new CIGAS) ඔස්සේ අංක 9180 දරණ ප්‍රධාන ලෙජරය(කල්බදු වත්කම් ) යටතේ ගිණුම්ගත කළ යුතුය.

II. පහත සඳහන් කාණ්ඩයන්ට අදාළව ලබාදී ඇති මිල සීමාව තුළ, එන්ජින් ධාරිතාවය 1600cc නොඉක්මවන ලියාපදිංචි නොකළ (නවතම) වාහන මෙම ක්‍රමය යටතේ මිලදී ගතහැකිය.

| කාණ්ඩය | විස්තරය | සියළු බදු ඇතුළත් මිල සීමාව (එක වාහනයකට රු.මි.) |
|---|---|---|
| ආ.i | අතිරේක ලේකම්වරු / අධ්‍යක්ෂ ජනරාල්වරු / මණ්ඩල සභාපතිවරු හෝ සමාන මට්ටමේ නිලධාරීන් | 12.00 |
| ආ. ii | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු /අධ්‍යක්ෂවරු හෝ සමාන මට්ටමේ නිලධාරීන් | 10.00 |
| ආ. iii | ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2010.05.14 දිනැති අංක CA/1/17/1 දරණ චක්‍ර ලේඛයට අනුව වාහනයක් සඳහා හිමිකම් ඇති ගරු අමාත්‍යවරුන්ගේ/රාජ්‍ය අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යය මණ්ඩලය | 10.00 |
| ආ.iv | ජනාධිපති ලේකම් කාර්යාලය මගින් නිකුත් කරන ලද 2011.12.19 දිනැති RCMD/1/4/23/4/4 දරණ චක්‍රලේඛයට අනුව ගරු ආණ්ඩුකාරවරුන්ගේ / ප්‍රධාන අමාත්‍යවරුන්ගේ / පළාත් අමාත්‍යවරුන්ගේ / පළාත් සභා සභාපතිවරුන්ගේ /පළාත් සභා නියෝජ්‍ය සභාපතිවරුන්ගේ කාර්ය මණ්ඩලය | 10.00 |
| ආ. v | අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරු | 9.00 |

III. විශේෂ අවස්ථාවන්හිදී කාර්යයන්හි ස්වභාවය සළකා බලා පහත සඳහන් කාණ්ඩයන්ට අදාළව ලබාදී ඇති මිල සීමාවන් තුළ කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයාගේ නිර්දේශයන්ට යටත්ව එන්ජින් ධාරිතාවය 3000cc නොඉක්මවනු ලබන ලියාපදිංචි නොකළ (නවතම) වාහන මිලදී ගතහැකිය.

| කාණ්ඩය | වාහන වර්ගය | සියළු බදු ඇතුලත් මිල සීමාව (එක් වාහනයකට රු.මි.) |
|---|---|---|
| ආ .vi | ඩබල් කැබ් රථ | 10.00 |
| ආ vii | ආසන සංඛ්‍යාව 16 නොඉක්මවනු ලබන වැන් රථ | 10.00 |

**(ඇ) මෙහෙයුම් කල්බදු ක්‍රමය:**

(i) පහත කාණ්ඩයන් වෙනුවෙන් ලබාදී ඇති බදු කුලී සීමාවන් තුළ, එන්ජින් ධාරිතාවය 3000cc නොඉක්මවන වාහන පමණක් මෙම ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කල හැකිය.

| කාණ්ඩය | වාහන වර්ගය | උපරිම මාසික බදු කුලිය වැට් රහිත (එක් වාහනයකට රු.) |
|---|---|---|
| ඇ .i | ඩබල් කැබ් රථ | 165,000 |
| ඇ .ii | ආසන සංඛ්‍යාව 16 නොඉක්මවනු ලබන වැන් රථ | 170,000 |

(ii) පහත සඳහන් කොන්දේසි සහ නියමයන් සපුරාලමින්, වාහන සැපයුම්කරු (කල්බදුකරු) විසින් ස්ථාවර බදුකුලී පදනමක් මත වසර පහක (මාස 60 ක) කාලයක් සඳහා සම්පූර්ණයෙන්ම නඩත්තු කරන ලද වාහනයක් සැපයිය යුතුය යන කොන්දේසියට යටත්ව තරඟකාරී ලංසු තැබීම හරහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමන කරමින් අදාළ වාහන ප්‍රසම්පාදනය කර ගැනීම එක් එක් රාජ්‍ය ආයතනයේ වගකීම වේ.

(අ) **සුදුසුකම්ලත් සැපයුම්කරුවන් (කල්බදුකරුවන්):** කල්බදුකරු, ශ්‍රී ලංකාවේ පවතින ලොව පිළිගත් වාහන වර්ග පිළිබඳ බලයලත් නියෝජිතයෙකු, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති මූල්‍ය ආයතනයක් හෝ අවම වශයෙන් වාහන 10 කට වඩා සංචිතයක් සහිත මෝටර් රථ කුලියට සැපයීමේ (මෝටර් රථ කුලී පදනම මත ලබාදෙන සමාගම්) සේවාවක් විය යුතුය.

(ආ) **වාහනයේ තත්ත්වය:** මෙම ක්‍රමය යටතේ ලබාගැනීමට නියමිත වාහන, කි.මී.1000 ට අඩු දුරක් ධාවනය කර ඇති නවතම හෝ ලියාපදිංචි නොකළ වාහන විය යුතුය.

(ඇ) **සැපයිය යුතු සේවාවන්:** රක්ෂණ සහ අනෙකුත් ආශ්‍රිත ගාස්තු මෙන්ම හදිසි අනතුරු හා අළුත්වැඩියාවන් පිළිබඳ වියදම්ද ඇතුළත් සියළුම නිරන්තර නඩත්තු වියදම් කල්බදුකරු විසින් දැරිය යුතුය. අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා පැය 24 කට වඩා වැඩි කාලයක් ගන්නේ නම්, බදු ගැණුම්කරුගේ අවශ්‍යතාවය අනුව කල්බදුකරු විසින් එම වාහනයට සමාන වර්ගයේ වාහනයක් ලබාදිය යුතුවේ.

(ඈ) **රියදුරු සහ ඉන්ධන:** මෙම ක්‍රමය යටතේ මිලදීගත් වාහන සඳහා රියදුරන් සේවයේ යෙදවීම සහ අවශ්‍ය ඉන්ධන සැපයීම අදාළ රාජ්‍ය ආයතනයේ වගකීම වන්නේය.

(ඉ) **ව්‍යවර්තනයන්:** කවර හෝ රජයේ සහනදායී බලපත්‍ර ක්‍රමයක් යටතේ ආනයනය කරන ලද වාහන මෙම ක්‍රමය යටතේ කල්බදු සඳහා ලබාදිය නොහැක.

(ඊ) **කල්බදුකරු සහ බදු ගැණුම්කරු අතර ගිවිසුම:** අදාළ රාජ්‍ය ආයතනය (බදු ගැණුම්කරු) සහ වාහන සැපයුම්කරු (කල්බදුකරු) විසින් සියළුම කොන්දේසි හා නියමයන් ඇතුළත් වන ගිවිසුමකට එළඹිය යුතුය. උචිත වෙනස්කම් සහිතව අදාළ රාජ්‍ය ආයතනයන් මගින් භාවිතා කළහැකි ගිවිසුමේ ආකෘතියක් **(ඇමුණුම V)**, මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ දක්වා ඇත. **(http://www.treasury.gov.lk)**

(උ) **ප්‍රතිපාදන හා ගිණුම්ගත කිරීම:** මෙම ක්‍රමය යටතේ වත්කමක් ඇති නොවන අතර, මෙම කාර්යය සඳහා වන වියදම්, මෙහෙයුම් වියදම් ලෙස සැළකිය යුතුය. මේ සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙනම පුනරාවර්තන වැය විෂයයක් යටතේ ලබාදෙනු ඇත.

(ඌ) **ගෙවීමේ ක්‍රමය:** එළඹෙන ලද ගිවිසුම ප්‍රකාරව අදාළ ආයතනය විසින් කල්බදු සමාගම වෙත මාසික පදනම මත බදුකුලී ගෙවීම් සිදුකිරීම සහතික වියයුතු අතර, ඊළඟ වර්ෂය සඳහා හිඟ මුදල් ගෙවීමට තබා නොගත යුතුය.

(එ) **තොරතුරු වාර්තාගත කිරීම :** අදාළ ආයතනය විසින් මෙම ක්‍රමය යටතේ මිලදීගත් වාහන පිළිබඳ වෙනම ලේඛනයක් පවත්වාගත යුතුය. වාහනයේ වර්ගය, වාහනයේ ලියාපදිංචි අංකය, බදුකුලී වටිනාකම සහ කාලය, අනුයුක්ත නිලධාරීන් ආදී තොරතුරු සුදුසු පරිදි වාර්තාගත කළයුතු අතර එම තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ලබාදිය යුතුය.

**06. වාහන භාවිතයෙන් ඉවත් කිරීම / බැහැර කිරීම**

(i) සියළුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස් අනුව වාහන බැහැර කිරීම පිළිබඳව සහතික විය යුතුය.

(ii) යම් වාහනයක් වෙනුවට වෙනත් වාහනයක් මිලදී ගැනීමට අනුමැතිය ලබාදෙන්නේ නම්, නව වාහනය ලියාපදිංචි කළ දින සිට මාස හතරක කාලයක් තුළ පවතින වාහනය විධිමත් ක්‍රමවේදයක් යටතේ බැහැර කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු , විශේෂ වියදම් ඒකක සහ අයවැය ප්‍රතිපාදන මගින් අරමුදල් සපයනු ලබන වෙනත් සියලුම රාජ්‍ය ආයතන සතුව පැවති වාහන බැහැර කිරීමෙන් ලැබුණු මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු අතර, පළාත් සභා සතුව පවතින වාහන එසේ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් අදාළ පළාත් සභා අරමුදලට බැර කළයුතුය. නව මිලදී ගැනීම සිදුකරනු ලබන්නේ බදුකුලී පදනම මත ලබාගත් වාහනයක් වෙනුවෙන් නම්, නව වාහනය මිලදී ගත් වහාම අදාළ බදුකුලී ගිවිසුම අවසන් කළ යුතුය.

**07. රජයේ වාහන අවභාවිතා කිරීම**

(i) අනුයුක්ත වාහන වෙනුවට ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන් හෝ අනුයුක්ත වාහන භාවිතා කරනු ලබන නිලධාරීන් වෙනත් කිසිදු සංචිත වාහනයක් භාවිතා කිරීමට හිමිකම් කියනු නොලැබේ.

(ii) මෙම චක්‍රලේඛයේ ඇති උපදෙස් පිළිපැදීමකින් තොරව රාජ්‍ය ආයතන කිසිදු වාහනයක් මිලදී නොගත යුතුය.

(iii) තනතුරට අනුව අනුයුක්ත වාහනයක් සඳහා හිමිකම් ඇති නිලධාරියෙකු හිමිකම් ලබන්නේ එක් (01) අනුයුක්ත වාහනයක් සඳහා පමණක් බවට සියළුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් වගබලාගත යුතුය.

(iv) ව්‍යාපෘතිවලට අදාළව යම් ගිවිසුමක් අනුව ප්‍රසම්පාදනය කළ හැකි නිශ්චිත වාහන සංඛ්‍යාවක් පැවතියද, රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතිත්වය දරනු ලබන කමිටුවක් මගින් වාහන අවශ්‍යතාවය සියුම්ව පරීක්ෂාකර බැලීමෙන් අනතුරුව එවැනි ඉල්ලීම් පිළිබඳව තීරණය කළයුතුය. අනුයුක්ත වාහන සඳහා හිමිකම් ඇති නිලධාරීන්ට එම අනුයුක්ත වාහනය හැර කිසිදු ව්‍යාපෘතියක් යටතේ මිලදී ගනු ලැබූ කිසිදු වාහනයක් වෙන් නොකළ යුතුය.

(v) රජයේ වාහන අවභාවිතය හෝ සාවද්‍ය පරිහරණය සිදු නොවන බවට සියළුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් සහතික විය යුතුය.

(vi) මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ප්‍රතිපාදන සහ අදාළ අනෙකුත් ප්‍රතිපාදන කඩ කිරීම මගින් රජයේ වාහන අවභාවිතය හෝ අයුතු පරිහරණය සිදුකිරීම සම්බන්ධව අදාළ බලධාරීන් විසින් විනයානුකූල පියවර ගතයුතුය.

**08. පූර්ව චක්‍රලේඛයන් අවලංගු කිරීම**

2016.03.17 දිනැති අංක 1/2016 දරණ සහ 2016.09.19 දිනැති අංක 1/2016(i) දරණ ජාතික අයවැය චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

**09. පැහැදිලි කිරීම**

වැඩිදුර පැහැදිලි කරගැනීම් සඳහා කරුණාකර ඔබගේ ආයතනය හා සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අදාළ නිලධාරියා හෝ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ නිලධාරීන් දු.ක. 011-2151425 මගින් සම්බන්ධ කරගන්න.

අත්.කළේ / **ආර්.එච්.එස්.සමරතුංග**

භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

(i) ජනාධිපති ලේකම්

(ii) අග්‍රාමාත්‍ය ලේකම්

(iii) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

(iv) විගණකාධිපති

(v) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(vi) කොම්ප්ට්‍රෝලර් ජනරාල්, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

*Annex I*

**Approval of the Department of National Budget for Procurement of Vehicles**

1. Name of the Ministry / Department / Public Institute ...................................

2. Type of Vehicle/s requested

| Category | Number of Vehicles | Method of Procurement (Outright purchasing/ Financial Leasing/ Operational Leasing) | Purpose of purchasing (assigned/ pool ) | If assigned, pl. specify (Minister, State Minister, Deputy Minister, Officer category, etc. ) | In case of replacement, details of the existing vehicle | |
|---|---|---|---|---|---|---|
| | | | | | Year of manufacture | Registration number |
| Sport Utility Vehicle (SUV) | | | | | | |
| Motor Car | | | | | | |
| Double Cab | | | | | | |
| Van | | | | | | |
| Other(pl. specify) | | | | | | |

3. Reason/s for the requirement of vehicle/s ..........................................
4. Source of funding (if provisions are available, indicate the vote particulars) ..........................................................................................................

5. Details of existing vehicles in the Ministry/Department/Public Institution

| Vehicle Type | Number of Vehicles | | | |
|---|---|---|---|---|
| | Age less than 05 years | Age 05-10 years | Age more than 10 years | Availability of Rented/hired Vehicles |
| Sport Utility Vehicle (SUV) | | | | |
| Motor Car | | | | |
| Double Cab | | | | |
| Van | | | | |
| Other(pl. specify) | | | | |

6. Contact information and recommendation

6.1. Contact Officer's name and telephone No. ................................

6.2. Recommendation ..............................................................................

.............................................
Head of the Department/Institution
Date....................................